# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1002/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 14/06/2024 පැය 1035

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.06.13 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 250 | - | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.06.13 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහරගම පොලිස් වසමේ පන්නිපිටිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 30 ක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන මහරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වූ පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මහරගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හැෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.06.13 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කඩවත පොලිස් වසමේ සූරියගම ප්‍රදේශයේදී හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 21 මිලි ග්‍රෑම් 390ක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන කඩවත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24ක් වන කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.** කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුර.**

2024.06.13 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පරයලාන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මඩු පොලිස් වසමේ අන්තෝනිආර්පුරම් ප්‍රදේශයේදී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මඩු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වූ පෙරියපුංචිකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මඩු පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**